# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1979 අංක 66 දරන
# අපරාධ නඩු විභාග
# (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ : 1979 නොවැම්බර් මස 9 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1979 නොවැම්බර් මස 16 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 20 යි    තැපැල් ගාස්තුව : ශත 25 යි

# 1979 අංක 66 දරන අපරාධ නඩු විභාග (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ : 1979 නොවැම්බර් මස 9 වන දින]

එල්.ඩී.—ඕ. 53/79

**1974 ජනවාරි මස 1 වන දින සිට 1979 ජූලි මස 2 වන දින දක්වා කාලය තුළ වලංගුව බලපැවැත් වූ නීතියේ විධිවිධාන යටතේ ආරම්භ කරන ලද නඩු විභාගවලට අදාළ තීන්දු, ඒ තීන්දුවලට හේතු සහ දණ්ඩන නියමයන් හා සම්බන්ධ කරුණු සඳහා ද ඒවාට අදාළ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1979 අංක 66 දරන අපරාධ නඩු විභාග (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (1) 1974 ජනවාරි මස 1 වන දින සිට 1979 ජූලි මස 2 වන දින දක්වා වූ කාලය තුළ වලංගුව බලපැවැත්වූ යම් නීතියක විධිවිධාන යටතේ යම් තීන්දුවක්, ඒ තීන්දුවට හේතු හෝ දණ්ඩන නියමයක් ඒ නීතියෙහි නිශ්චිතව දැක්වෙන කාලපරිච්ඡේදයක් තුළ වාර්තාගත කිරීමට නියමිතව තිබුණු අවස්ථාවක දී, ඒ තීන්දුව, තීන්දුවට හේතු හෝ දණ්ඩන නියමය එකී කාලපරිච්ඡේදය තුළ දී වාර්තාගත කිරීමට නොහැකිවීම හේතුකොට ගෙන යුක්තිය ඉටුවීම සැලකිය යුතු ප්‍රමාණයකින් සිදු නොවී ඇත්නම් මිස, ඒ තීන්දුව, තීන්දුවට හේතු හෝ දණ්ඩන නියමය එකී කාලපරිච්ඡේදය තුළ දී වාර්තාගත නොකිරීම ඒ තීන්දුවේ, තීන්දුවට හේතුවල හෝ දණ්ඩන නියමයේ වලංගු භාවය කෙරෙහි බලපාන ලෙස හෝ බලපා ඇති ලෙස හෝ නොසැලකිය යුතු ය. ඇතැම් අපරාධ නඩු විභාගවල තීන්දු හෝ දණ්ඩන නියමයන් නිර්බල නොවන බව.

(2) අභියාචනයක් වශයෙන් හෝ අන්‍යාකාරයකින් හෝ යම් අධිකරණයක විනිශ්චයට භාජනව පවත්නා සියලු කාරණාවලට (1) වන උපවගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.